**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනෙයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
---------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 53,574,104 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආයතනය කටයුතු කර ඇති බවත් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොදීම නිසා 2019 වර්ෂය තුළ ගිණුම්ගත කිරීම සිදු නොකරන ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2012 පෙබරවාරි 01 දින වැඩ නිම කරන ලද පුස්තකාල ගොඩනැගිල්ලෙහි වටිනාකම රු. 64,171,020 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණ ද එම ගොඩනැගිල්ලේ වටිනාකමට ඇතුලත් විය යුතු රු. 4,513,788 ක් අවසන් බිල්පත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. ඒ අනුව ගොඩනැගිලි වටිනාකම රු. 4,513,788 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ අගය ගොඩනැගිල්ලේ පිරිවැයට ඉදිරියේදී එකතු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගොඩනැගිලි පිරිවැය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් වල ඇතුලත් ප්‍රාග්ධන ප්‍රදානවලින් මිලදී ගන්නා ලද රු.761,800 ක් වූ අස්පෘශ්‍ය වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය සහ ක්‍රමක්ෂය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2020 වර්ෂයේ සිට අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) අස්පෘෂ්‍ය වත්කම් ගිණුම් තැබීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ දී මානව ප්‍රාග්ධන සංවර්ධනය වෙනුවෙන් දරන ලද රු. 330,000 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී අස්පෘශ්‍ය වත්කම් යටතේ සඳහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කම් ගිණුම් තැබීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු 13 දිනැති අංක 862/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය | | | |
| (අ) නියමාවලියේ 5 ඡේදය | අධ්‍යක්ෂක මණ්ඩලය සඳහා නිලබලයෙන් පත්වන කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපතිවරයා 2018 වර්ෂයේ සිට එකම රැස්වීම් වාරයක් සඳහාවත් සහභාගිවී නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් විද්‍යායතනය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කර තිබුණද වාර්තාවේ දිනය දක්වාම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පීඨාධිපතිවරයාගේ නියෝජනය ලබා ගැනීම ප්‍රායෝගිකව ගැටළු සහගත බැවින් නියමාවලියේ 9(F) ඡේදය වෙනස් විය යුතු බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා යවා ඇත. | අවශ්‍ය පරිදි නියමාවලිය සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) නියමාවලියේ 6 ඡේදය | විද්‍යායතනයේ අධ්‍යක්ෂ තනතුර 2018 ඔක්තෝම්බර් 17 දිනෙන් පසුව පුරප්පාඩු වීමත් සමග ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවස්ථා දෙකකදී නිසිබලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණ ද එකී තනතුර සඳහා පූර්ණ කාලීන ස්ථිර අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි. | පනතේ 20(4) (ආ) වගන්තිය යටතේ අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව එම පත්කිරීම් සිදුකර ඇත. | විද්‍යායතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා නියමාවලියේ 6 ඡේදයට අනුව පූර්ණකාලීන ස්ථිර අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.80,540,075 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,898,494 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.72,641,581 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පෞද්ගලික පඩිනඩි වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනයේ කියවීම් ශාලාව භාවිතයට නුසුදුසු තත්ත්වයෙන් පවතින බැවින් වැඩ ඉංජිනේරුවරයා විසින් මෙම ගොඩනැගිල්ල වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු බවට 2019 ජනවාරි 09 දින නිර්දේශ කර තිබුණද 2019 වර්ෂය අවසාන වනවිටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | පාංශු පරීක්ෂණ වාර්තාව මේ වනවිට ලැබී ඇති අතර ඉඩම් ගොඩනැගිලි කමිටු නිර්දේශය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතව ඇත. | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වතුපිටිවල පිහිටා ඇති හෙක්ටර්යාර් 2.3533 ක් වූ ඖෂධ උද්‍යානය 2013 සැප්තැම්බර් 12 දින විද්‍යායතනය වෙත පවරා දී වසර 6 ක් ගත වී ඇතත් එම භූමිය විධිමත් ලෙස සකස් කර ඖෂධ ගුණයෙන් යුත් ශාක වගා කිරීම් හා ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීමට වාර්තාවේ දිනය දක්වාම අපොහොසත් වී තිබුණි. | 2019 වර්ෂයේ පරිපාලනමය වශයෙන් වෙනස්කම් සිදුවීම නිසා අඛණ්ඩ සංවර්ධන ක්‍රියාවලියකට යාමට නොහැකි විය. | සංවර්ධන කටයුතු සිදු කර ඖෂධීය ගුණයෙන් යුත් ශාක වගා කර සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) විද්‍යායතනය සඳහා ආචාර්යවරුන් 34 දෙනෙකු අනුයුක්තව සිටියද 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පර්යේෂණ ප්‍රදාන සඳහා ඉල්ලීම් කර නොතිබුණි. එසේම 2019 වර්ෂයේ රු.1,000,000 ක් පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා වෙන්කර තිබුණද වර්ෂය අවසාන වනවිටත් එම සියළු මුදල් ඉතිරිවී තිබීමෙන් ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලය පර්යේෂණ සඳහා යොමුවීම අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ පර්යේෂණ ප්‍රදාන ඉල්ලුම්පත් ලැබී තිබුණද ඒ සියල්ල සායනික පර්යේෂණ බැවින් ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා නැවත යොමු කිරීමට අයදුම්කරුවන් වෙත යොමුකර ඇත. | ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලය පර්යේෂණ කටයුතු සඳහා යොමු කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |
| (ඇ) ආයුර්වේද වෛද්‍ය විද්‍යා උපාධි පාඨමාලාවේ කාලසීමාව වසර 5ක් වුවද ශිෂ්‍යයින් හා පරිපාලනය අතර ඇති වූ අර්බුධකාරී හේතූන් නිසා අධ්‍යයන වර්ෂ දීර්ඝවීමත් සමඟ පාඨමාලාව සම්පූර්ණ කිරීමට වසර 6ක පමණ කාලයක් ගතවන බව නිරීක්ෂණය විය. 2019 දෙසැම්බර් මාසය වනවිට වසර 6 ක කාලය ඉක්මවූ විද්‍යාර්ථයින් 68 දෙනෙකු උපාධිය සම්පූර්ණ කිරීමට ප්‍රමාද වීම මත තවදුරටත් විද්‍යායතනය තුළ රැඳී සිටින බව නිරීක්ෂණය විය. | ශිෂ්‍යයන් දේශන හා විභාග කල්දැමීම දේශන හා විභාග වර්ජනය කිරීම යන කරුණු හේතුවෙන් නියමිත කාලපරිච්ඡේදය තුළ උපාධිය අවසන් කිරීමට නොහැකි විය. | නියමිත කාලපරිච්ඡේදය තුළ උපාධි පාඨමාලාව අවසන් කිරීමට හැකි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඈ) විභාග කටයුතු පැවැත්වීම පිළිබඳ පරීක්ෂාවේදී මූලධර්ම අධ්‍යයන අංශයේ අධ්‍යයන දින දර්ශනය අනුව Level I සහ Level II වසරවල ඉගෙනුම ලබන සිසුන් 130 ත් 106 ත් අතර සංඛ්‍යාවක් වෙනුවෙන් 2019 දෙසැම්බර් පවත්වන ලද මධ්‍ය වාර්ෂික (Mid Semester) විභාග සඳහා පිළිවෙලින් සිසුන් 3 ත් සිසුන් 6 ත් අතර ඉතා සුළු සංඛ්‍යාවක් පමණක් පෙනීසිට තිබුණි. | සිසුන් බහුතරයක් විභාගයට පෙනී නොසිටියද සියළු විභාග නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කර ඇත. | අදාළ විභාග වෙනුවෙන් සිසුන් පෙනී සිටිය යුතු බව අවධාරණය කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) උපාධි අපේක්ෂක සංවර්ධන වැඩසටහන යටතේ ආයුර්වේද වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ගේ පංචකර්ම පුහුණුවීම් කටයුතු සඳහා හා පරිගණක කටයුතු පිළිබඳ කුසලතා සංවර්ධනය වෙනුවෙන් 2010 ඔක්තෝම්බර් 18 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෙන්කර තිබූ රු.මිලියන 3ක මුදලින් ඉතිරි ශේෂය වූ රු.1,214,142 ක් හා අරමුදල් 06 ක එකතුව රු. 2,240,628 ක් වසර කිහිපයක සිට අදාළ අරමුණු සඳහා වැය නොකර ඌන උපයෝජිතව පැවතුණි. | ඉදිරියේදී එම අරමුදල් උපයෝගී කර ශිෂ්‍යයන්ගේ අධ්‍යයන, පර්යේෂණ හා ක්‍රීඩා කටයුතු සඳහා යෙදවීමට උපදෙස් දී ඇත. | පවතින අරමුදල් ශේෂ එකී අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝගී කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විද්‍යායතනය වෙත ලබා දුන් ප්‍රාග්ධන ප්‍රදානවලින් රු.178,989,779 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාළ කටයුතු සඳහා උපයෝජනය නොකර නිශ්ක්‍රීයව පැවතුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් හා ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළුකාරී තත්ත්වයන් නිසා අරමුදල් භාවිතා නොකරන ලදී. | ප්‍රාග්ධන ප්‍රදාන අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 79 ක්වූ වර්ග මීටර් 990 ක මහල් 04 කින් යුත් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2011 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද වැඩ ආරම්භ කිරීමේදී විධිමත් අනුමැතියකින් තොරව එය වර්ග මීටර 1,475 ක් දක්වා වැඩිකර තිබුණි. එබැවින් විද්‍යායතනයට අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතාවයක් ඇති වීම නිසා ඉදිකිරීම් කටයුතු සැලසුම්කළ | අනුමැතිය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමුකරන ලද ලිපියට පිළිතුරු වශයෙන් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කොටස් ආයතනයේ ඉපයූ අරමුදල් භාවිතා කර සිදුකරන ලෙස දන්වා ඇත. | ඉදිකිරීම් කටයුතු අනුමත ඇස්තමේන්තු යටතේ නිමකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පරිදි නිමකර ගැනීමට නොහැකිව මහල් දෙකක පමණක් වැඩ නිමකර කාර්යාල කටයුතු ආරම්භ කර තිබුණි. | | |
| (ආ)(i) ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 134.5 ක්වූ දේශනශාලා පහසුකම්ද ඇතුළත්ව ඉදිකිරීමට නියමිත සිව්මහල් අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2014 සැප්තැම්බර් 18 දින ආරම්භ කර තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරු සමඟ ඇති වූ ආරවුලක් මත 2018 පෙබරවාරි 25 දින කොන්ත්‍රාත්කරු විසින් කොළඹ වාණිජ අධිකරණයේ නඩුවක් පවරා තිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කටයුතු කිරීමට සිදුවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු 2019 ජූලි 03 වන දින නඩුව ඉල්ලා අස්කරගෙන තිබුණි. නඩුව ඉල්ලා අස්කර ගැනීමෙන් පසු වසරක් ගතවී තිබුණද ඉතිරි වැඩකටයුතු ආරම්භ කිරීමට අපොහොසත්වී තිබුණි. | කොන්ත්‍රාත් සමාගම වෙත හිඟ බිල්පත් නිරවුල් කිරීමෙන් පසුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතව ඇත. | ඉදිකිරීම් කටයුතු නොපමාව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) වසර 5 කට වඩා වැඩි කාලයක් අඩක් නිම කළ ගොඩනැගිල්ල අව් වැසිවලට නිරාවරණය වීමෙන් මහල් හරහා ජලය ගලා බැසයාම හා පහත මාලයේ ජලය පිරී පැවතීම නිසා ගොඩනැගිල්ල ක්‍රමයෙන් විනාශ වීමේ තත්ත්වයට පත්වෙමින් පවතින බව නිරීක්ෂණය විය. | ඉක්මනින් වහලය සකස් කිරීමට කටයුතු කරන බවත් ඉදිකිරීම් කටයුතු නව කොන්ත්‍රාත් සමාගමක් මඟින් ඉටුකිරීමට අමාත්‍යංශ අනුමැතිය ලැබී ඇත. | ගොඩනැගිල්ල විනාශ වන තත්ත්වයෙන් ආරක්ෂා කර, ඉතිරි ඉදිකිරීම් කටයුතු නොපමාව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 50 ක් වුවද තත්‍ය සංඛ්‍යාව 36 ක් විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 14 ක් පැවතියදී එක් කථිකාචාර්යවරයෙකු සප්ත වාර්ෂික නිවාඩුද ආධුනික කථිකාචාර්යවරුන් දෙදෙනෙකු අධ්‍යයන නිවාඩුද ලබා ගෙන තිබූ බැවින් අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සියයට 28 ක පමණ ඌනතාවයක් යටතේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලද තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් 15 දෙනෙකු අනුමත කර තිබූ නමුත් ස්ථිර ආචාර්යවරුන්ගේ පවතින පුරප්පාඩු හේතුවෙන් අනුමත සංඛ්‍යාවට වඩා 06 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර තිබුණි. | ස්ථිර කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ස්ථිර කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක 5 ක් යටතේ කාර්යයන් 74 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද ඉන් මුදල් අයකර පවත්වන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනිම ද ඇතුළත්ව කාර්යයන් 11 ක් ඉටුකර ගෙන නොතිබුණි. ඉටුකර තිබූ කාර්යයන් 24 හි ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | වසරක් තුළ පරිපාලනය වෙනස්වීම හා ශිෂ්‍ය උද්ඝෝෂණ සේවක වැඩවර්ජන පැවතීම ප්‍රගතිය අඩුවීමට බලපා ඇති බව. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකාවේ හෝ පිටරට විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ඉගැන්වීම්, පුහුණු කිරීම් හා පර්යේෂණ කටයුතු සඳහා ආචාර්යවරුන් හා ශිෂ්‍යයන් හුවමාරුකර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම විද්‍යායතනයේ කාර්යභාර්යයක් වුවද එය 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට හා ක්‍රියාත්මක කිරිමටද කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | විද්‍යායතනයේ කාර්යභාරයන් ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛනය සමඟ තත්‍ය අගයන් සැසඳීමේදී සියයට 50 සිට සියයට 100 දක්වා පරාසයක් තුළ විචලතාවයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | ආයතනය තුළ පැවති පාලනය කළ නොහැකි තත්ත්වයන් මෙම විචලතාවයට හේතු වූ බව. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදා ගත යුතුය. |